# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2131/4 - 2019 ජූලි මස 08 වැනි සඳුදා - 2019.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : WEG/LAN/LI/ACQ/53.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ලිවල ගමේ පිහිටි මූ. පි. මාර 2791 පිඹුරේ මතු සඳහන් ඉඩම මාර්ග සංවර්ධන අධිකාරියට අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ඒකල කප්පරතොට පාර, වරිපනම් අංක 118හි කොටසක් හෙවත් ඒකල දකුණු බස්නාහිර කැබැල්ල, කප්පරතොට පාර; වර්තමාන ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්: චන්ද්‍රසිරි අලවත්ත, අංක 135, නව ගාලු පාර, කප්පරතොට, වැලිගම; ප්‍රමාණය: හෙක්. 0.0986.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 අගෝස්තු මස 28 වැනි දින පූ.භා. 9.30 ට වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 අගෝස්තු මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. පී. ජී. සුමිත් ශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2019 ජූලි මස 02 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

07 - 733

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම (460 වැනි පරිච්ඡේදය)

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : HIK/DS/LND/INV/27.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 3/2013/HW/188.

2019.03.23 වැනි දින නිකුත් කරන ලද අංක 2115/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ පළකළ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් මු.පි.ගා. 4321 කැබලි අංක 01හි දක්වා ඇති 2019.04.30 දිනය වෙනුවට 2019.07.29 දිනය ද, 2019.05.14 දිනය වෙනුවට 2019.07.22 දිනය ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශකර සිටිමි.

ඒ. එම්. ඒ. යූ. ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

07 - 734/1

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම (460 වැනි පරිච්ඡේදය)

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : HIK/DS/LND/INV/23.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/4/2013/HW/409.

2019.03.23 වැනි දින නිකුත් කරන ලද අංක 2115/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ පළකළ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් මු.පි.ගා. 4216 කැබලි අංක 01හි දක්වා ඇති 2019.04.30 දිනය වෙනුවට 2019.07.29 දිනය ද, 2019.05.14 දිනය වෙනුවට 2019.07.22 දිනය ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශකර සිටිමි.

ඒ. එම්. ඒ. යූ. ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

07 - 734/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.